**දෙහිඕවිට ප්‍රාදේශීය සභාව**

**කෑගල්ල දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 04 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ජුනි 07 සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව **දෙහිඕවිට** ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට **දෙහිඕවිට** ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු. 6,000,000 ක් ලෙසට ඇස්තමේන්තු කර ගිණුම් ගත කර තිබුණද, අදාල කාර්ය මණ්ඩල දීමනා සඳහා ප්‍රතිපාදන වෙන් කර නොතිබුණි.

1.3.1 නොසැසඳුන පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 06 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 18,558,512 ක් වූ අතර, උපයෝගී ලේඛන/ වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 19,002,198 ක් වූයෙන් වෙනස රු. 443,686 ක් විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 7,385,964 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,378,816 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) වරිපනම් හා බදු | 3,523 | 3,289 | 234 |
| (ii) බදු කුලී | 4,913 | 4,905 | 07 |
| (iii) බලපත්‍ර ගාස්තු | 820 | 783 | 37 |
| (iv) වෙනත් ආදායම් | 31,353 | 28,731 | 2,626 |

#### 2.2.2 උසාවි දඩ

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 4,673,256 ක් විය.

### 2.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

වටිනාකම රු. 157,400 ක් වූ වත්කම් නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරික්ෂණ වලදී අනාවරණය විය.

2.4 කොන්ත්‍රාත් පාලනය

-------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) <u>අල්හම්බ්‍රාවත්ත පාර කොන්ක්‍රීට් කිරීම.</u>

කර්මාන්තයේ මුළු වැඩ වටිනාකමින් 10%ක මුදලක් රඳවා ගැනීමෙන් පසු රු. 137,651 ක් ගෙවා තිබුණි. ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 05 ට අනුව 1.2.4 (3/4) මිශ්‍රණයෙන් අඟල් 04 ක් ඝණකමින් පාර කොන්ක්‍රීට් කළ යුතුව තිබුණද මාර්ගය ආරම්භක ස්ථානයේ සිට අඩි 02 ත් 12 ත් අතර ප්‍රමාණය අඩි 3 ක් පළලට සම්පූර්ණ මාර්ගයේම කොන්ක්‍රීට් ස්ථරය පුපුරා ගොස් තිබූ අතර, ඝණකම අඟල් 1 ½ ක් විය. මේ අනුව මාර්ගයේ ආරම්භක ස්ථානයේ සිට අඩි 25 ක් දුරට මාර්ගයේ කොන්ක්‍රීට් මිශ්‍රණය නියමිත ප්‍රමිතියෙන් හා ඝණකමින්ද තොරව ඉදි කර තිබූ බව 2012 ඔක්තෝබර් 25 දින අල්හම්බ්‍රාවත්ත පාර කොන්ක්‍රීට් කිරීම පිළිබඳ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අනාවරණය විය.

(ආ) <u>පිරිවෙන පාර නාය ගිය ස්ථානයේ පැති බැම්ම ඉදි කිරීම.</u>

රු. 210,462 ක් වැය කර ඉදි කරන ලද කර්මාන්තයේ ඇස්තමේන්තුවේ වැඩ විෂය අංක 05 ට අනුව PVC 3 ½" නල මගින් ජල කාන්දු 20 ක් පැති බැම්මේ 1 වන අදියරයේදී යෙදිය යුතු වුවද, ජල කාන්දු සිදුරු කිසිවක් නොතිබූ බව 2012 ඔක්තෝබර් 25 දින කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අනාවරණය විය.

2.5 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දෙහිඕවිට, තල්දුව, ගුරුගල්ල, මාදොල හා පනාවල නගර වලින් රැස් කරන කැලි කසල දෙහිඕවිට නව වෙළඳ සංකීර්ණය ඉදි කරනු ලබන භූමියට ගෙනැවිත් දමන බැවින් නගරයේ දැඩි දුර්ගන්ධයක් පැවතියද එය පාලනය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ මහා මාර්ග සීමාවන් උල්ලංඝනය කර ඉදි කරන ලද අනවසර ගොඩනැගිලි 09 ක් සම්බන්ධව ක්‍රියා මාර්ග ගැනීම සඳහා සභාව දැනුවත් කිරීම මාර්ග සංවර්ධන අධිකාරිය ක්‍රියා කර තිබුණද ඒ සම්බන්ධව කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) සේවක ණය

(ඇ) ගබඩා පාලනය

(ඈ) කොන්ත්‍රාත් පාලනය